## බළන්ගොඩ නගර සභාව
## 2022-03-30 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.03.30**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රුමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රිනී | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රිනි | අයි.ඒ.එම්. ඉලංකෝන් මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා, ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව ගරු සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ අතර, බළන්ගොඩ නගර සභාව සඳහා අවශ්‍ය තාර බැරල් 100 ක් හා

කෝලාස්ට් බැරල් 08 ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් විවෘත කිරීම හා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බව පවසන ලදී.

**01.** බළන්ගොඩ නගර සභාව සඳහා අවශ්‍ය තාර බැරල් 100 ක් හා කෝලාස්ට් බැරල් 08 ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් විවෘත කිරීම හා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීම

ඒ අනුව බළන්ගොඩ නගර සභාව සඳහා අවශ්‍ය තාර බැරල් 100 ක් හා කෝලාස්ට් බැරල් 08 ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් විවෘත කිරීම හා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදි.

මිල ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

එහි දී අනුමත කරන ලද පහත සඳහන් තීරණය ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

- බළන්ගොඩ නගර සභාව සඳහා අවශ්‍ය තාර බැරල් 100 ක් හා කෝලාස්ට් බැරල් 08 ක් මිලදී ගැනීම සඳහා මිල ගණන් බිතුලින්ක් ඉමල්ෂන් ආයතනය, ජී.කේ.යූ.සී. ප්‍රයිවට් ලිමිටඩ් හා බිටුමික්ස් ප්‍රයිවට් ලිමිටඩ් යන ආයතන තුනෙන් ඉදිරිපත් වී තිබුණි.

- ඒ අනුව තාර බැරල් සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ බිතුලින්ක් ඉමල්ෂන් ආයතනය මඟින් තාර බැරල් 01 ක් රු. 35,280.00 ක් බැගින් තාර බැරල් 100ක් මිලදී ගැනීමටත්, කෝලාස්ට් සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ බිතුලින්ක් ඉමල්ෂන් ආයතනය මඟින් එකක් රු. 32,000.00 + Vat බැගින් කෝලාස්ට් බැරල් 08 ක් මිල දී ගැනීමටත් ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉහතින් ලබාගත් තීරණ ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

අනතුරුව ගරු සභාපතිතුමන් විසින් අද දින කාරක සභා අවස්ථාවේ දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා සහ එම්.ඩබ්. විමලසිරි මැතිතුමා අතර ඇති වූ ගැටුම සම්බන්ධව එම අය වෙනුවෙන් තමන් සියලුම දෙනාගෙන් සමාව ඉල්ලා සිටින බව පවසමින් අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු උප සභාපති ඇතුලු

නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 10.17 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

ඩබ්.ඒ. වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.